**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2019**

**-------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතු භාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතු භාවය, පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සංගමය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුලත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>ශ්‍රී.ල.ගි.ප්‍ර.07</u><br>ආපදා ණය වාරික ලැබීම් රු.15,075,390 ක් හා ආපදා ණය ගෙවීම් රු.29,515,488 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන් වශයෙන් නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගලපා තිබුණි. | එකඟ වේ.<br>ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව කෙරීගෙන යන වැඩ ලෙස සහ අත්තිකාරම් ලෙස දක්වා ඇති පිළිවෙලින් රු.1,583,595 ක මුදලක් හා රු.2,074,958 | එකඟ වේ.<br>මෙම කාර්යයන් මේ වන විට නවතා ඇති බැවින් නැවත ගිණුම් සටහන් මඟින් නිවැරදි | ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ක මුදලක් **2014** වර්ෂයේ සිට පැවත එන ශේෂයක් වන අතර ඒවා අත්හිටුවන ලද ඉදිකිරීම් සඳහා දරන ලද වියදම් විය. එම වටිනාකම් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකර වසර **05** ක් තිස්සේ තවදුරටත් ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. තවද අත්හරින ලද ඉදිකිරීම් වෙනුවෙන් වැය කර තිබූ තවත් රු.**1,325,805** ක මුදල දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණු අතර අදාළ වටිනාකම වත්කම් ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එම නිසා එම වටිනාකමින් වත්කම් වැඩිපුර දක්වා තිබුණි. | කිරීමක් සිදුකළ නොහැක. රු.**2,074,958** ක මුදල බාහිර අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. | |
| ආ) | මණ්ඩලයට අයිති නොමැති ඉඩමක ඉදිකිරීමේ කටයුත්තක් වෙනුවෙන් දරණ ලද රු.**492,392** ක මුදලක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණද එම මුදල තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස නිරීක්ෂණය විය. ඒ නිසා දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.**492,392** කින් වැඩිපුර දැක්වුණු අතර ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ. මෙම ඉඩම සම්බන්ධයෙන් අවසන් තීරණයන්ට එළඹ නොමැති බැවින් අදාළ වත්කම ගිණුම්වලින් ඉවත්කිරීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස සටහන් කළ නොහැකි බව | අදාළ විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කර නොතිබුණු කාර්යයක් වෙනුවෙන් **2020** වර්ෂයේ දී දරන ලද රු.**1,421,842** ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ සහ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එකඟ වේ. මෙම කාර්ය **2020** වර්ෂය වන විට නිමකර ඇති බව | අදාළ විධිවිධාන ප්‍රකාරව ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතු වීම. |
| ඈ) | මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වෙන අවසන් තොගය තුළ වටිනාකම රු.**2,853,172** ක් වූ ප්‍රයෝජනයට ගත නොහැකි තොග ඇතුළත් වී තිබූ නිසා අවසන් තොගය එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි. | එකඟ වී ඇත. | අවසන් තොගය තුලින් ප්‍රයෝජනයට ගත නොහැකි තොග ඉවත් කළ යුතු වීම. |
| ඉ) | ප්‍රචාරණ රථයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතුව පැවති රු.**1,515,300** ක මුදලක් ගිණුම්ගත නොකර ඇති අතර එම වටිනාකමින් දේපළ පිරියත හා උපකරණ සහ ගෙවිය යුතු වියදම් ගිණුම්වල ශේෂයන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වී ඇත. | ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. |

**1.5.4** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.732,951 ක් වූ පෙර වර්ෂවල ටිකට්පත් මුද්‍රණ වියදම් ගිණුම් ශේෂය සම්බන්ධයෙන් අදාළ තහවුරු කිරීමේ සාක්ෂි නොමැති වීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | එකඟ වේ. ජර්නල් සටහන් ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ජර්නල් සටහන් තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි හා වියදම් විස්තර ඉදිරිපත් කල යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විධිමත් ලෙස සම්පූර්ණ වූ පසුව ඉතා කඩිනමින් විගණනය වෙත ලබාදෙන ලෙස 2016 වර්ෂයේ සිට විගණන විමසුම් හා තොරතුරු ඉල්ලීම් ලිපි ගණනාවකින් ඉල්ලා තිබුණද එම තොරතුරු කඩිනමින් විගණනය සඳහා ලබාදීමට කටයුතු කර නොතිබුණි. එසේම එම කාලපරිච්ඡේදය තුල පැවති විගණන කමිටු රැස්වීම්වලදී ද මෙම තත්ත්වය නිවැරදි කරන බවට එකඟවී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා තීරණ, විධිමත් ලෙස සම්පූර්ණ කර කාල ප්‍රමාදයකින් තොරව විගණනයට ලබාදීමට කටයුතු වීම. |

**1.6** ලැබිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලොතරැයිවල අලෙවිය වර්ධනය කරගැනීම සඳහා ත්‍යාග ලෙස ලබාදීමට මිලදීගත් මෝටර් රථ 2 ක් හා යතුරුපැදි 01 ක් ප්‍රදර්ශන රථ ලෙස අලෙවි නියෝජිතයින් වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රදර්ශන කාලසීමාව තුලදී එකී වාහන අනතුරුවලට ලක්වී රු.236,608 ක අලාභ හානි සිදුවී තිබුණි. එකී අලාභය අලෙවි නියෝජිතයින්ගෙන් අයකර ගන්නා බව මණ්ඩලය විසින් විගණනය වෙත එවාතිබුණු පිළිතුරේ සඳහන් කර තිබුණද ඉන් රු.177,667 ක් පමණක් ලැබිය යුතු ශේෂය ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, ඉතිරි රු.58,941ක මුදල | එකඟ වේ. | විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කිරීම හා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මින් **2019** වර්ෂය තුළදී රු.**12,566** ක් පමණක් අයකර ගෙන තිබුණි. | | |
| (ආ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක **234** දරන ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කිරීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.**723,780** ක මුදල හා වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.**4,252,440** ක මුදල යන මුදල්වල එකතුව වන රු.**4,976,220** ක් දැනට වසර **15** ක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | එකඟ වේ. මේ සම්බන්ධව ක්‍රියා කිරීමට මුදල් අමාත්‍යාංශය මඟින් කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අනුව කටයුතු කරන බව. | දීර්ඝ කාලීනව අයවිය යුතු මුදල් අයකර ගැනීම හෝ ඒවා විධිමත් පරිදි නිරවුල් කළයුතු වීම. |
| (ඇ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ලබාගත් ගොඩනැගිල්ලක් වෙනුවෙන් මණ්ඩලය විසින් බාහිර පාර්ශ්වයන්ට ලබාදී තිබූ රු.**2,520,000** ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් නැවත අයකර දෙන ලෙස ඉල්ලා මණ්ඩලය විසින් අවුරුදු **23** කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව **2016** ජනවාරි **11** දින ලැබී තිබුණි. එම තීන්දුව අනුව අදාල මුදල අයකර ගතයුතු වුවත් තීන්දුව ලැබී දැනට වසර **03** කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාල මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. මෙම තැන්පතු මුදල ලබා ගැනීමට අධිකරණ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදුකරන බවත්, මෙතෙක් එම කටයුතු අවසන් වී නොමැති බවත්. | - එම - |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **VIII** පරිච්ඡේදයේ **4.1** ඡේදය | - ක්ෂේත්‍ර නිලධාරීන් අතිකාල ගෙවීම් සඳහා හිමිකමක් නොමැති නිලධාරීන් ලෙස දන්වා තිබුණද මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් හට සමාලෝචිත වර්ෂයේදී රු.**1,122,318** ක් වූ අතිකාල දීමනා ගෙවා තිබුණි. | එකඟ වේ. මෙම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රජයේ නිවාඩු දිනවල රාජකාරි කටයුතු අභිප්‍රේරණය කිරීම සඳහා නිවාඩු දිනවල අතිකාල දීමනා ගෙවනු ලබන අතර ඉදිරියේදී රජයේ නිවාඩු දිනවල එම සේවය අවශ්‍ය බැවින් එම ගැටළුව | විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2019.11.01 දින මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමුකර ඇත. අදාළ අනුමැතිය මෙතෙක් ලැබී නොමැත. | |
| | | - මාණ්ඩලික නිලධාරීන්ට 1/20 දීමනාව ලබාගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දිනකට පැය 08 ක් අනිවාර්යයෙන්ම රාජකාරී කල යුතු වුවත් මණ්ඩලය විසින් මෙම විධිවිධාන නොසලකා නිවාඩු දිනවල මාණ්ඩලික නිලධාරීන් වැඩකල පැය ගණන මත පැයට පැය එකහමාරක් බැගින් අනුපාතිකව අතිකාල දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. තවද එම දිනවලදීම මාණ්ඩලික නිලධාරීන් දිනුම් ඇදීමේ කාර්යය සඳහා සහභාගී වී එම දීමනාවද ලබාගෙන තිබුණි. | එකඟ වේ.<br>මෙම දීමනාව වසර 17 කට අධික කාලයක සිට ගෙවා ඇත. පැය 04 ක සේවා අවශ්‍යතාවයක් පවතින විටක පැය 08 ක සේවය රඳවාගෙන ගෙවීම මණ්ඩලයට ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන නිසා එසේ සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 272 (3) | සියලුම ගෙවූ වවුචර් ඒවාට අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොවැඩි කාලයක් ඉකුත්වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් මණ්ඩල විසින් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර්පත් විගණනයට ඉදිරිපත් කිරීමේදී මාස 1 ත් 7 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. | එකඟ වේ.<br>ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි | - එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 20 කදී උපරිම සීමාව ඉක්මවා රු.3,481,827 ක් අග්‍රිම ලබාදී තිබුණි. | එකඟ නොවේ.<br>රු.100,000 ඉක්මවා මුදල් අග්‍රිමයක් ලබා ගන්නා අවස්ථාවේදී සභාපතිතුමා/ සාමාන්‍යාධිකාරීගේ විශේෂ අනුමැතියන් අභ්‍යන්තර මැමයක් මඟින් ලබාගෙන කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| | 371 (2) (ආ) | - මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අතුරු අග්‍රිම ලබාදිය යුතු වුවත් 2019 වර්ෂය තුලදී වටිනාකම | ප්‍රායෝගිකව හා සෘජුව අදාළ ව්‍යාපෘතීන් හා සම්බන්ධ නොවීම මත | මුදල් රෙගුලාසිවලට අනුකූලව |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.10,727,741 ක් වූ අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරීන්ට ලබාදී තිබුණි. | එම අතුරු අග්‍රිම ලෙස ලබාගෙන මුදල් පියවීමේදී ප්‍රායෝගිකව ගැටළු මතු විය හැකි බව. | කටයුතු කල යුතු වීම. |
| | | - තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවීමේදී එම කාර්යයන්ට අදාල ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 219 කදී රු.1,680,806 ක ඉතිරිවීම් වාර්තා වී තිබුණි. | එකඟ වේ.<br>හදිසි අවස්ථාවන්හිදී ඇස්තමේන්තු සකස් නොකරන අතර මාණ්ඩලික නිලධාරීන්ගේ නිරීක්ෂණ හා අනුමැතිය යටතේ ගෙවීම් සිදුකරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| | **(iii)** මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | - යම් නිශ්චිත කාර්යයක් සඳහා ලබාගන්නා ලද අත්තිකාරම් එකී කාර්ය නිමවූ වහාම පියවිය යුතු වුවද 2019 ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා අවස්ථා 12 කදී රු.650,500 ක අත්තිකාරම් දින 18 ත් 47 ත් අතර කාලපරාසයක් තුල පියවීම් ප්‍රමාද කර තිබුණි. | එකඟ වේ.<br>මෙම වරද නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති අතර අත්තිකාරම් පියවා නොමැති අවස්ථාවක නැවත අත්තිකාරම් ලබා නොදෙනු නොලැබේ. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4/2018 දරන චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 1.1.1 ඡේදය | මණ්ඩලය සතු සියළුම වාහන තක්සේරු කලයුතු වුවත් රු.8,958,763 ක් වටිනා යතුරු පැදි 44 ක් හා 2009 වර්ෂයේදී රු.7,882,371 කට මිලදීගන්නා ලද හයිවුන්ඩායි වර්ගයේ මෝටර් රථයක් සඳහා තක්සේරු වටිනාකම ලබාගෙන නොතිබුණි. | එකඟ වේ.<br>යතුරුපැදි 18 ක් අපහරණය කිරීමට යෝජිත බැවින් ප්‍රත්‍යාගණනය කර නැත. අනෙක් යතුරු පැදි ක්ෂේත්‍ර අලෙවි බලකායට ලබාදී ඇති බැවින් එක් දිනක් සියලු යතුරුපැදි කොළඹට රැගෙන එම ප්‍රායෝගිකව අපහසු නිසා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රත්‍යාගණනය කර නොමැත. අපහරණය කිරීමට සැලසුම් කර තිබූ නිසා සොනොටා මෝටර් රථය තක්සේරු දෙපාර්තමේන්තුවට යැවූ වාහන ලැයිස්තුවට ඇතුළත්ව නොමැති බැවින් ප්‍රත්‍යාගණනය වී නොමැත. | |
| | **(ii) 1.3.3** ඡේදය | විධිවිධාන ප්‍රකාරව වාහන කාණ්ඩ **3** කට වර්ග කර, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂක නිලධාරියකු සහ මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු ඇතුලත්ව ආයතන ප්‍රධානියා විසින් පත්කරන ලද තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් මඟින් වාහන තක්සේරු කල යුතු විය. එහෙත් එසේ කටයුතු නොකර තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා ගෙන තිබුණි. | එකඟ වේ. **2020** වර්ෂය තුලදී යතුරුපැදි හා අනෙකුත් සියලුම මෝටර් රථ, චක්‍රලේඛය පරිදි ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සූදානම් කර ඇති බව. | පවත්නා චක්‍රලේඛ හා මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | **2015** ජූලි **10** දිනැති අංක **02/2015** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **9** ඡේදයේ (අ) වගන්තිය | විධිවිධාන ප්‍රකාරව යම්කිසි වාහනයකට ලියාපදිංචි අයිතිය, ආයතනයේ නමට නොපවතින අවස්ථාවක එවැනි වාහනවල අයිතිය ආයතනය වෙත ලියාපදිංචි කිරීමෙන් අනතුරුව පමණක් අපහරණ ක්‍රියාවලිය සිදුකල යුතුය. නමුත් අලෙවි නියෝජිතයකුට ලබාදීම සඳහා **2013** වර්ෂයේදී රු.**411,500** කට මිලදී ගෙන තිබූ ත්‍රීරෝද රථය ලියාපදිංචි කිරීමකින් තොරව **2017** ජූලි මාසය දක්වා ඔහු භාරයේ තබා ඇති අතර පසුව මණ්ඩලය වෙත ගෙනවිත් භාරදී තිබුණි. එය මේ වන තෙක් ලියාපදිංචි කර නොතිබුණු අතර **2020** ජුනි **29** දින අපහරණය කිරීම සඳහා ලංසු කැඳවා තිබුණි. | එකඟ වේ. ඉදිරියේදි මෙවැනි ත්‍යාග භාණ්ඩ මිලට ගෙන ප්‍රදර්ශන කුටි සඳහා ලබානොදීමට කටයුතු කරන බව. | ලියාපදිංචි නොකළ වාහනයක් බැවින් අපහරණය කිරීමේදී ගැටළු පවතින බැවින් පවත්නා නීතිරීති හා චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,668,792,667 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,187,603,956 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.481,188,711 හෙවත් සියයට 22 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ බදුපෙර ලාභයෙන් හිඟ ආදායම් බදු ඇතුළුව රු.553,166,576 ක් නැතහොත් සියයට 20 ක බදු වියදමක් දැරීමත් එය සමාලෝචිත වර්ෂයේදී රු.235,073,385 ක් හෙවත් සියයට 08 ක් ලෙස අඩුවීමටත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරුණි.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ටිකට්පත් විකුණුම් ආදායම රු.1,210,557,766 කින් හෙවත් සියයට 7.6 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ටිකට් පත් 07 ක අලෙවිය වැඩිවී තිබූ අතර ලග්න වාසනා ටිකට්පතේ අලෙවි ආදායම සියයට 75 කින් වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ වෙනත් ආදායම් රු.7,705,644 කින් හෙවත් සියයට 3.8 කින් පහළ වැටී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සංසන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ටිකට්පත් වියදම රු.57,774,472 කින් හෙවත් සියයට 14.2 කින් වැඩිවී තිබුණි. මෙහිදී ටිකට්පත් 06 ක මුද්‍රණ වියදම වැඩිවී තිබූ අතර ලග්න වාසනා ටිකට්පතේ මුද්‍රණ වියදම වැඩිවීම සියයට 90.8 ක් වී තිබුණි.

(ඈ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී ත්‍යාග වියදම රු.607,081,273 කින් හෙවත් සියයට 7.3 කින් වැඩිවී තිබුණි. 2019 වර්ෂයේදී ටිකට්පත් 07 ක තෑගි වියදම වැඩිවී ඇති අතර ලග්න වාසනා ටිකට් පතේ තෑගි වියදම වැඩිවීම සියයට 75.2 ක් වී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බෙදාහැරීමේ පිරිවැය රු.268,626,423 කින් හෙවත් සියයට 6.7 කින් වැඩිවී තිබුණි. එම වැඩිවීමට අලෙවිකරණ ආශ්‍රිත පිරිවැය රු.28,850,334 කින් හෙවත් සියයට 190.3 කින් වැඩිවීම ද, අලෙවි නියෝජිත කොමිස් රු.310,479,817 කින් හෙවත් සියයට 10.7 කින් වැඩිවීම සහ බෙදාහැරීමේ කොමිස් රු.16,023,158 කින් හෙවත් සියයට 7.8 කින් වැඩිවීමද හේතුවී තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පරිපාලන වියදම සියයට 17 කින් හෙවත් රු.78,180,497 කින් වැඩිවී තිබුණි. මෙහි වැඩි වූ ප්‍රමාණයෙන් රු.33,546,676 ක්ම සේවක පාරිශ්‍රමික නියෝජනය වන අතර එහි වැඩිවීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 12 කි. ඊට අමතරව පරිපාලන වියදමේ වැඩිවීමට මෘදුකාංග නඩත්තු වියදමේ රු.1,314,800 ක් හෙවත් සියයට 11 කින් වැඩිවීමද වෛද්‍ය වියදම් හා රෝහල් ගාස්තු වියදමේ සියයට 35 හෙවත් රු.9,440,856 කින් වැඩිවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

**සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්, ලාභදායීත්වය හා ද්‍රවශීලතාවය දැක්වෙන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.**

| | 2019 | 2018 |
|---|---|---|
| | -------- | -------- |
| <u>මෙහෙයුම්</u> | සියයට | සියයට |
| විකුණුම් ආදායමට විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 25 | 25 |
| විකුණුම් ආදායමට විකුණුම් පිරිවැය | 58 | 58 |
| <u>ලාභදායීත්ව අනුපාත</u> | | |
| දළ ලාභ අනුපාතය | 42 | 42 |
| ශුද්ධ ලාභ අනුපාතය | 16 | 14 |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස | 89 | 89 |
| ශුද්ධ ලාභයෙන් ත්‍යාග පවරා තිබීමේ අනුපාතය | 13 | 17 |
| ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය | 9 | 25 |
| <u>ද්‍රවශීලතා අනුපාතය</u> | | |
| ජංගම අනුපාතය | 1:1.63 | 1:1.37 |
| ක්ෂණික අනුපාතය | 1:1.60 | 1:1.31 |

**පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.**

**(අ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් කරනු ලබන විකුණුම් හා බෙදාහැරීමේ වියදම්, විකුණුම් මිලෙන් සියයට 25 ක් ලෙස සමාන අගයක් ගෙන තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විකුණුම් හා බෙදාහැරීමේ වියදම් අනුපාතය මුළු මෙහෙයුම් වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 89 ක ඉහළ අගයක් ගෙන තිබුණි. මෙසේ අධික පිරිවැයක් දැරීම මණ්ඩලය ලබන ශුද්ධ ලාභයට ඍජුව බලපාන අතර එය ජනාධිපති අරමුදලට සිදුකරන දායකත්වයටද අහිතකර ලෙස බලපා ඇති බැව් නිරීක්ෂණය විය.**

**(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී උපයා ඇති ශුද්ධ ලාභයෙන් සියයට 13 ක්ම නියෝජනය කර ඇත්තේ පාරිභෝගික ජනතාවට ලබාදිය යුතු ත්‍යාග ආපසු පවරා ගැනීම මඟිනි. මෙම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේදී සියයට 17 ක අගයක් පෙන්නුම් කර තිබුණු අතර ශුද්ධ ලාභයට ආදායම් බදු අනුපාතය සියයට 25 සිට සියයට 09 දක්වා පහළ අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.**

**(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.1,210,557,766 ක් එනම් සියයට 8 කින් අඩු වී තිබීමට සාපේක්ෂව විකුණුම් පිරිවැය රු.673,451,784 කින් එනම් සියයට 7 කින් පහළ යාම දළ ලාභ අනුපාතය සියයට 42 ක ඒකාකාරී මට්ටමක පැවතීම කෙරෙහි බලපා තිබුණි.**

**(ඈ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාත පිළිවෙලින් 1.37 හා 1.63 ක අගයක් විය. ඒ අනුව මණ්ඩලයේ ජංගම වත්කම් අනුපාතය ප්‍රශස්ථ මට්ටමෙන් පවතින බවක් නිරීක්ෂණය නොවන හෙයින් සමාලෝචිත වර්ෂයේදී ද කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රවාරණ උපක්‍රමයක් ලෙස මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රය තුළ LED දැන්වීම් පුවරු නිර්මාණය කර සවිකිරීමේ කාර්යය සඳහා ආලෝක පුවරු ඡායාරූපකරණය (Artwork and Production) වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු පදනම් කරගෙන රු.952,000 ක මුදලක් අදාළ සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. නමුත් ඇස්තමේන්තුවේ සඳහන් පරිදි මෙම ඡායාරූපකරණය සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. තවද දැන්වීම් පුවරු සවිකර ඇති ස්ථාන අනුව ඒවා මහජනතාව වෙත ප්‍රදර්ශනයක් සිදුනොවන බවද නිරීක්ෂණය විය. | මණ්ඩලයේ සාමාජීය වගකීම මෙන්ම ලොතරැයි සන්නම් පිළිබඳව දැනුවත් කිරීමට මෙම දැන්වීම් පුවරු උපකාරී කරගෙන ඇති බවත් ඡායාරූපගත කිරීමේදී එම අවස්ථාවල වෙනස්කම් සිදු වී ඇති බවත් දන්වා ඇත. ඡායාරූප මිලදීගැනීමට දරන පිරිවැයද, අමතර ශිල්පීන් සඳහා ගෙවන වියදමද, අන්තර්ජාලයෙන් බාගත කරන ඡායාරූප සඳහා දරන සමහර වියදම්ද සහ මණ්ඩලයේ එකඟතාවය මත දෙවරක් දැරීමට සිදුවූ වියදම්ද මෙහි ඇතුලත්ව ඇත. | ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවලට අනුව කටයුතු කර ඇත්දැයි පරීක්ෂා කර බලා ගෙවීම් කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 ප්‍රමාණවත් අධිකාරී බලයක් නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ කළමනාකරණ සහකාර කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 146 දෙනෙකු සඳහා 2016, 2017, 2018 හා 2019 වර්ෂයන් සඳහා නිල ඇඳුම් දීමනා ලෙස වසරකට රු.5,000 බැගින් රු.2,175,000 ක් ගෙවා තිබුණි. නමුත් 2016 සැප්තැම්බර් 01 දින මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ MF1/05/01/DLB/04 දරන ලිපිය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ රැකියාවේ ස්වරූපය අනුව ඔවුන්ට නිල ඇඳුමක් ලබාදීම අවශ්‍ය නොවන බැවි මණ්ඩලයේ සභාපතිවරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව 2016 සිට 2018 වර්ෂය දක්වා නිල ඇඳුම් දීමනා ගෙවීම නතර කර තිබුණි. නැවත මණ්ඩලයේ ඉල්ලීම පරිදි | 2019.01.07 දිනැති අංක PE/TR/DLB/Gen/2018 දරන ලිපිය මඟින් අනුමැතිය දීමේදී දැනටමත් ගෙවන බැවින් ඒ සඳහා එකඟතාවය ලබාදී ඇති බැවින් 2016, 2017 හා 2018 යන වර්ෂ සඳහාද වෘත්තීය සමිති, සභාපතිතුමා සමඟ පවත්වන ලද සාකච්ඡාවේදී කරන ලද ඉල්ලීම පරිදි මෙම දීමනාව ගෙවා ඇති බව. | විධිමත් අනුමැතියක් යටතේ දීමනා ගෙවීමේදී කටයුතු කළ යුතු වීම. |

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019 ජනවාරි 07 දින මෙම නිල ඇඳුම් දීමනාව ඉදිරියටත් ගෙවීමට අනුමැතිය ලබාදී ඇති නමුත් ඉකුත් වර්ෂ 3 ක් සඳහා එම දීමනාව ගෙවීමට අනුමැතිය ලබාදුන් බවක් නිරීක්ෂණය නොවීය. ඒ අනුව 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සමාලෝචිත වර්ෂය තුලදී ගෙවන ලද නිල ඇඳුම් දීමනාව වූ රු.1,540,000 ක මුදල අනුමැතියකින් තොර ගෙවීමක් විය.

## 3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් 2008 වර්ෂයේදී රු.8,095,000 වටිනා කැබ් රථයක් ණය පදනම මත නියෝජිත ආයතනයකින් මිලදීගෙන තිබූ අතර එය මණ්ඩලයේ නමින් ලියාපදිංචි කර පසුව එවකට හිටපු සභාපති විසින් රැගෙන ගොස් තිබුණි. එම වාහනයේ වටිනාකම මණ්ඩලය විසින් නොගෙවීම මත 2012 වර්ෂයේදී මණ්ඩලයට විරුද්ධව අදාල සමාගම නඩු පවරා තිබුණි. එකී නඩුව 2018 නොවැම්බර් 16 දින අවසන් කර තිබුණු අතර වාහනයේ වටිනාකම, නෛතික පොළිය හා නඩු ගාස්තු ලෙස රු.18,834,979 ක් ගෙවීමට මණ්ඩලයට නියම වී තිබුණි. ඒ අනුව ඉන් රු.14,923,369 ක් 2019 ඔක්තෝබර් 14 දින ගෙවා තිබුණි. | එකඟ වේ.<br>මේ හේතුවෙන් ආයතනයට වූ අලාභය අදාළ වුදිතගෙන් අයකර ගැනීමට නීති කටයුතු සිදුකිරීමට කටයුතු කර ඇති බව. | විධිමත් පරිදි අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දින දිනුම් අදිනු ලැබූ "අද කෝටිපති" විශේෂ ලොතරැයි ටිකට්පත් 100,000 ක් NB-8153 අංක දරන වාහනය මඟින් අලෙවි කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ 5 දෙනෙකු යොදවා තිබුණි. ඉන් රු.300,000 ක ආදායමක් හා රු.163,750 ක ලාභයක් ඉපයීමට මණ්ඩලය සැලසුම් කර තිබුණද දින 16 ක් තුල 5 දෙනෙකු විසින් ටිකට්පත් 24,000 ක් පමණක් අලෙවි කිරීම හේතුවෙන් ඉපයූ ලාභය රු.72,000 ක් පමණක් විය. නමුත් ඒ වෙනුවෙන් දැරීමට සිදුවූ වියදම රු.254,250 ක් වීම හේතුවෙන් රු.182,250 ක අලාභයක් මණ්ඩලයේ අරමුදලින් දැරීමට සිදුවී තිබුණි. | එකඟ නොවේ.<br>මෙම වැඩසටහන්වලදී අලෙවි ඉලක්ක ලබාදී තිබුණද ප්‍රධාන අරමුණ වන්නේ මණ්ඩලයේ සන්නම ජනතාව අතර ප්‍රචලිත කිරීම වේ. තවද විශේෂ ත්‍යාග පිළිබඳව අදාළ ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමද මෙහි ප්‍රධාන අරමුණක් වේ. | විධිමත් අලෙවි උපක්‍රම භාවිතා කර අලෙවිය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉහළ කලමනාකාරීත්වය විසින් ගෙන ඇති තීරණ අනුව සාමාන්‍ය ක්‍රමය යටතේ ණයට ටිකට්පත් අලෙවි කිරීමේදී අදාල ණය මුදල ඊට පසුදින පියවිය යුතු අතර එසේ කිරීමට අපහසු වුවහොත් අදාල අලෙවි නියෝජිතට නැවත ටිකට්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය නතර වේ. එහෙත් **2019** දෙසැම්බර් **31** දිනට මාස **08** සිට මාස **27** දක්වා වූ කාලයක සිට අලෙවි නියෝජිතවරුන් **05** දෙනෙකුගෙන් රු.**2,660,369** ක මුදලක් අයනොවී පවතින බව නිරීක්ෂණය විය. | එකඟවී ඇත. | ඉහළ කළමනාකාරීත්වය ගෙන ඇති තීරණ විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) මණ්ඩලය විසින් සුපර්බෝල් ලොතරැයියේ **914** වැනි දිනුම් වාරය හා ශනිදා වාසනා ලොතරැයියේ **3125** වැනි දිනුම් වාරය විශේෂ දිනුම් ඇදීමේ වාර ලෙස පවත්වා තිබුණි. මෙහිදී අවස්ථා **12** කදී වාහන යොදා ගනිමින් මිනිස් දින **153** ක් තුලදී සුපර්බෝල් ටිකට්පත් **18,800** ක්ද, අවස්ථා **07** කදී මිනිස් දින **74** ක් යොදා ගනිමින් ශනිදා වාසනා ටිකට්පත් **21,400** ක්ද අලෙවි කර තිබුණි. මෙම ටිකට්පත් දෙක අලෙවි කිරීම සඳහා සහභාගී වූ කාර්ය මණ්ඩලයට වැටුපට අමතරව යැපීම් දීමනා, අතිකාල දීමනා හා ඉන්ධන වියදම් ලෙස රු.**305,582** ක මුදලක් වැයකර තිබුණද මිනිස් දිනකට සුපර් බෝල් ටිකට්පත් **10**ක්ද ශනිදා වාසනා ටිකට් පත් (මිනිස් දිනකට ) **41**ක්ද අලෙවි කර තිබුණි. | එකඟ නොවේ. මෙවැනි වැඩසටහන්වලින් අලෙවි ප්‍රවර්ධනය හා ලොතරැයි පිළිබඳ ජනතාව දැනුවත් කිරීම අපේක්ෂා කරන අතර අලෙවි ප්‍රවර්ධනයේදී ටිකට්පත් අලෙවි කිරීම කළ යුතු නිසා ඒ සඳහා සහභාගී වන මණ්ඩලයේ සාමාජිකයන්ට අලෙවි ඉලක්කයන් ලබාදී ඇත. විශේෂ දිනුම් ඇදීම පිළිබඳව මෙම ප්‍රදේශයේ ජනතාව දැනුවත් කරමින් ලබාදෙනු ලබන අතිරේක විශේෂ ත්‍යාගයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ප්‍රධාන අරමුණ වේ. | විධිමත් අලෙවි උපක්‍රම භාවිතා කර අලෙවි ප්‍රවර්ධනය හා අලෙවිය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) **2018** අගෝස්තු **28** දින සිට සැප්තැම්බර් **01** දින දක්වා මොණරාගල ප්‍රදේශයේ පැවැත්වූ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය වෙනුවෙන් මණ්ඩලය විසින් රු.**3,325,821** ක වියදමක් දරා තිබුණු අතර විකුණුම් ඉලක්කයෙන් සියයට **41** ක් වූ රු.**4,100,000** ක විකුණුම් ආදායමක් ලබාගෙන තිබුණි. එහෙත් ටිකට්පතක සාමාන්‍ය විකුණුම් වියදම රු.**3.50** ක් වුවද මෙම ප්‍රදර්ශන භූමිය තුල ටිකට්පත් විකිණීමේදී එය රු.**16.22** ක් දක්වා වැඩිවී තිබුණු බැවින් සාමාන්‍ය අලෙවි ක්‍රියාකාරීත්වය තුලින් උපයන ලාභයට වඩා රු.**2,607,000** කින් මණ්ඩලයේ ලාභය අඩු වී තිබුණි. | එකඟ නොවේ. මේ සම්බන්ධව වැය ශීර්ෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර අනුමැතිය ලබාගෙන ඇති අතර එම කටයුතු සම්බන්ධීකරණය කරන ලද කාර්ය මණ්ඩලයට දරන ලද වියදම් හා අලෙවිය සංසන්දනය කිරීම ප්‍රායෝගික නොවේ. මුදල් අමාත්‍යාංශයේ උපදෙස් | වෙළඳ ප්‍රචාරණය හා අනෙකුත් ප්‍රචාරණය සඳහා දැනටමත් විශාල වියදමක් දරන අතර ආදායම් හා වියදම් ඉලක්ක තුලින් විකුණුම් ප්‍රවර්ධනය කරගැනීමට කටයුතු කල යුතුවීම. |

| | | |
|---|---|---|
| | පරිදි අනෙකුත් රාජ්‍ය ආයතන මෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයද අනුග්‍රාහකයකු ලෙස මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී වී ඇත. මෙහි මූලික අරමුණ වන්නේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සන්නාම නාමය ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන ජනතාව අතර ප්‍රචලිත කිරීමයි. | |
| (ඉ) **2019** වර්ෂයේ මණ්ඩලයේ මුද්‍රණ වියදම රු.**424,023,033** ක් වූ අතර නොවිකිණි ඉතිරි වූ ටිකට්පත්වල මුද්‍රණ වියදම රු.**31,812,417** ක් විය. මේ අනුව ඉතිරි වූ ටිකට්පත්වල මුද්‍රණ වියදම මුළු මුද්‍රණ වියදමෙන් ප්‍රතිශතයක් ලෙස සියයට **7.5** කි. මෙම ඉතිරි ටිකට්පත්වල මුද්‍රණ වියදම මුද්‍රණ වියදමෙන් සියයට **5** ක මට්ටමක පවත්වාගැනීම සම්බන්ධව විගණන විමසුම් මඟින් මණ්ඩලය දැනුවත් කලද සමාලෝචිත වර්ෂයේදීද එය ඉටුවී නොතිබුණි. | එකඟ වේ. පාස්කු ප්‍රහාරය හේතුවෙන් පැවති වාතාවරණය යටතේ මෙය කළමනාකාරීත්වයට පාලනය කළ නොහැකි තත්ත්වයක් වූ බැවින්, විකිණීමට නොහැකිව ඉතිරි තොගයේ වටිනාකම ඉහළ ප්‍රතිශතයක් ගෙන ඇති බව. | ඉතිරි ටිකට්පත්වල මුද්‍රණ වියදම මුද්‍රණ වියදමෙන් සියයට **5** ක මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.5** නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලෙවි ප්‍රවර්ධන කටයුතුවලට සමගාමීව සිදුකරන වැඩසටහන්වලදී භාවිතා කිරීම සඳහා දිස්ත්‍රික්කයකට **10** බැගින් කොඩි කණු **250** ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.**1,000,000** ක පිරිවැයක් මණ්ඩලය විසින් **2018** වර්ෂය තුළ දරා තිබුණි. එසේ මිලදීගත් කොඩි කණු තොගය මණ්ඩලය තුල ඉතා අනාරක්ෂිත ආකාරයට ගබඩාකර තිබුණු අතර මිලදීගත් දින සිට ඒවා කිසිඳු අලෙවි ප්‍රවර්ධන වැඩසටහනකට භාවිතා කර නොතිබුණි. | එකඟ වේ. කොඩි කණු සුරක්ෂිතව ගබඩා කිරීම සඳහා ස්ථානයක් වෙන් කරන බවත්, ප්‍රවර්ධන අවශ්‍යතාවලදී මෙම කොඩි කණු භාවිතා කරන බවත් දන්වා ඇත. | අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු කර විධිමත් පරිපාටීන්වලට අනුව අදාළ අයිතම් ප්‍රසම්පාදනය කරගැනීමට කටයුතු කළ යුතුවීම. |

## 3.6 ප්‍රසම්පාදන ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අලෙවි ප්‍රවාරණ රථ සකස් කිරීම.**<br><br>2018 වර්ෂයේදී රු.5,565,000 කට මිලදීගන්නා ලද Rear body රහිත Double Wheel කෘ කැබ් රථය අලෙවි ප්‍රවාරණ රථයක් ලෙස සකස් කිරීමට 2018 ඔක්තෝබර් 18 දින U-Sri ආයතනයට භාරදී ඇති අතර 2020 ජුනි 30 දින වන විට වසර 1 යි මාස 08 ක් ගතවී ඇති නමුත් සිදුකර තිබුණේ ලොරි බොඩියේ සැකිල්ල සාදා පිටත ආවරණ යෙදීම හා පසු පස කොටසේ දොරවල් සවිකිරීම පමණි. ප්‍රවරණ අලෙවි රථයක් මිලදීගැනීම සඳහා රු.මිලියන 10.2 ක ප්‍රතිපාදන තිබියදී, ලොතරැයිපත් ප්‍රවාහනය කිරීම සඳහා මිලදීගත් වාහනයක් මෙලෙස හදිසියේම අලෙවි රථයක් ලෙස සකස් කිරීමට තීරණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 වගන්තියේ විධිවිධාන සැලකිල්ලට නොගෙන පිරිවිතරයන් සකස් කර මිල ගණන් කැඳවා තිබූ අතර 2009 අංක 8 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ 6 (1) වගන්තියේ විධිවිධානවලට පටහැනිව රථයේ ප්‍රමාණයද වෙනස් කර තිබුණි. තවද මෙම කාර්ය සඳහා මිලදීගන්නා ලද භාණ්ඩවල වසරක් සඳහා වූ වගකීම් කාලයෙන් මාස 8 ක් අවසාන වී තිබීම, වත්කම හා එහි උපාංගවල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම, වාහනය ලියාපදිංචි කිරීමේ අවදානමක් පැවතීම හා කාර්ය සාධන ඇපකරවල වලංගුකාලයද ඉක්මවා ගොස් තිබීම යනාදී කරුණු මත රු.12,670,000 වැයක් දැරීමට යෝජිත මෙම මෙහෙයුම් කටයුත්ත මූල්‍ය ප්‍රකාශනවල නියමිත ගිණුම්වලින් හෙළිදරව් කිරීමේ ප්‍රශ්නගත බවක් විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>මෙය අදියර කිහිපයක් යටතේ ඉටුකර ඇති අතර එක් එක් අදියරවල සිදුවූ විවිධ ප්‍රමාදයන් හේතුවෙන් මෙම තත්ත්වය සිදුවී ඇති ඇත. එම රථය 2020 අගොස්තු මස 15 දින වන විට අවසන් කිරීමට නියමිතය. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම හා මේ සම්බන්ධව ඉහළ කළමනාකාරිත්වයේ අවධානය යොමු කළ යුතු වීම. |

## 3.7 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සැලැස්ම<br><br>2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4.2.1 ඡේදය ප්‍රකාරව සපයා ඇති ආකෘතිය අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වුවත් මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශය ලේකම් විසින් අනුමත කර නොතිබුණි. | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ මේ තත්ත්වය ඇති බවත් සෑම වර්ෂයකම ප්‍රසම්පාදන සැලැස්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන නමුත් අනුමැතිය ලැබී නොමැති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

(ආ) ලොතරැයි මුද්‍රණ ආයතන තෝරාගැනීම.

| | | | |
|---|---|---|---|
| **(i)** | **2013** ජනවාරි **02** දිනැති අංක **01/2013** හා **2017** ඔක්තෝබර් **09** දිනැති අංක **4** දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ, **2006** ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **7.6.7, 7.7.1 (අ), 795 (ඇ), 796 (ආ) (iii), 8.5.1 (අ)** හා (ආ) මාර්ගෝපදේශ සහ **2008** දෙසැම්බර් **17** දිනැති අංක අප**/08/2356/306/145/TBR** දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය යනාදී විධිවිධාන ප්‍රකාරව සැපයුම්කරුවන් තෝරාගත යුතු වුවත් ලොතරැයි මුද්‍රණ ආයතන තෝරාගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණු අවස්ථා විය. අවස්ථා කීපයක් පහත දැක්වේ.<br>- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ එකඟතාවයකින් තොරව ප්‍රසම්පාදන නිර්ණායක ඇතුළත් කර ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම හේතුවෙන් මණ්ඩලයට වාසිදායක මුද්‍රණ ආයතන ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත් වීම.<br>- අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්ණායකවලට අනුකූල නොවූ ආයතනද ලංසු ඇගයීම සඳහා තෝරාගැනීම.<br>- ප්‍රතිචාර දක්වා නොමැති ලංසුකරුවන් ඇගයීම් සඳහා තෝරාගැනීම.<br>- | මේ සම්බන්ධව විස්තරාත්මක පිළිතුරක් ලබාදී ඇතත් එම පිළිතුර විගණනය විසින් පිළිගෙන නොමැති බව පෙනේ. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වඩාත් සුදුසු ආකාරයට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර ඇත. අදාල චක්‍රලේඛ හා ප්‍රසම්පාදන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව "දේශීය ප්‍රමුඛත්වය" ටිකට් මුද්‍රණ කාර්යය සඳහා අදාල කරගත නොහැක. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව කටයුතු කළ යුතු වීම. |
| **(ii)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.5, 8.5.1** (අ) (ආ) (ඇ) (ඈ) විධිවිධාන සැලකිල්ලට නොගෙන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අභියාචනා ලංසුකරුවන් වෙත දැනුම්දීම, අභියාචනා සඳහා ප්‍රමාණවත් කාලයක් ලබානොදීම හා අභියාචනා ප්‍රතික්ෂේප කිරීම. | - එම - | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| **(iii)** | මණ්ඩලයේ සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු විය. මෙම විෂය භාරව කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) හා සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් මුද්‍රණ දෝෂයන් පිළිබඳ දැනුවත් වී සිටියදී, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් දෝෂ නොමැති බව වාර්තා කිරීම හා සැපයුම්කරුවන් දෙදෙනෙකු පිළිබඳව සෑහීමකට පත්විය හැකි බව වාර්තා කර තිබීම. | අවම මිල ගණන් සහිත ලංසුකරු තෝරාගෙන ඇති බවත් සුදුසුකම් නොලැබූ ලංසුකරුවන්ගේ මිල ගණන්වලට සාපේක්ෂව කොන්ත්‍රාත්තුව පවරන ලද මිලගණන් සසඳා බලා අලාභයක් සිදුකර ඇති බවට ප්‍රකාශ කළ නොහැකි බව පෙන්වා ඇත. | - එම - |

| | | |
|---|---|---|
| **(iv)** **2018** මාර්තු **25** දින දිනුම් අදින ලද කෝටිපති ශනිදා **271** වැනි දිනුම් වාරයට නියමිත ලොතරැයිපත්වල වැරදි ත්‍යාග රටාවක් මුද්‍රණය කිරීම මත රු.**320,000**ක් අතිරික්ත ත්‍යාග මුදලක් ගෙවීමට මණ්ඩලයට සිදුවී තිබීම, ගිවිසුම් ප්‍රකාරව අදාල මුද්‍රණ ආයතනයෙන් අයකරගත යුතු රු.**320,000** ක මුදල අයකරගෙන නොතිබීම සහ වැරදි දත්තයන් මුද්‍රණය කිරීම හේතුවෙන් අයකරගත යුතු රු.**500,000** ක මුදලද අයකර නොගැනීම. | එම මුද්‍රණ දෝෂ සුළු මුද්‍රණ දෝෂ බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව මුද්‍රණ ආයතනයෙන් අයකර ගත යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(v)** අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන පාර්ශවය විසින්ම අභියාචනා කැඳවීම සඳහා අසාර්ථක ලංසුකරුවන්ට දැනුම්දීමේ ලිපි යොමුකිරීම, අභියාචනා මණ්ඩලය වශයෙන් කටයුතු කරන ඒකාබද්ධ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කර තිබීම සහ එම කමිටුවේ තීරණය මත යලිත් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අනුමැතිය ලබාදීම යනාදී කටයුතුද සිදුකර තිබීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳව විගණනයේදී ප්‍රශ්නගත වීම. | ටෙන්ඩරයට අදාළ අභියාචනා ක්‍රියාවලිය අමාත්‍යාංශය මඟින් සිදුකරන ලබන බැවින් ඒ පිළිබඳ මතයක් ප්‍රකාශ කළ නොහැකි බව. | ජාතික ප්රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** ත්‍යාග මිලදී ගැනීම. **(රු.2,342,360)** | | |
| **(i)** සුපර්බෝල් විශේෂ ලොතරැයියේ ත්‍යාග ලෙස ලබාදීමට තීරණය කර තිබූ ජංගම දුරකථන **20** ක් සඳහා රු.**672,860** ක මුදලක් වෙන්කර තිබුණු අතර මෙම මිලදීගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව සිදුකර තිබුණි. | එකඟ නොවේ. තරඟකාරීව ලංසු මිල ගණන් කැඳවා සභාපතිගේ අනුමැතිය පරිදි මෙම මිලදී ගැනීම සිදුකර ඇති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| **(ii)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.9.1** පරිච්ඡේදයේ (ආ) වගන්තිය ප්‍රකාරව රු.**500,000** ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් අද කෝටිපති විශේෂ දිනුම් වාරය සඳහා රු.**1,669,500** ක් වටිනා යතුරුපැදි මිලදී ගැනීමේදී ගිවිසුමකට එළඹ නොතිබුණි. | එකඟ වේ. විෂයගත කරුණු ගැටළුවකින් තොරව සිදුවී තිබෙන අතර මතභේදයක් ඇති වී නොමැති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| **(ඇ)** පානීය ජල බෝතල් මිලදී ගැනීම. **(රු.1,911,663)** | | |
| මණ්ඩලය විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පානීය ජල බෝතල් මිලදීගැනීම සඳහා **2016** වර්ෂයේදී ආයතනයක් | එකඟ වේ. **2020** වර්ෂයේදී නිවැරදි කිරීමට | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ |

| | | | |
|---|---|---|---|
| | තෝරාගෙන තිබුණු අතර 2019 වර්ෂයේ විගණිත දිනය දක්වා එම ආයතනයෙන් පමණක් පානීය ජල බෝතල් මිලදී ගනිමින් පැවතුණි. | කටයුතු කර ඇත. | විධිවිධානවලට අනුකූලව වාර්ෂිකව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් ආයතන තෝරාගත යුතු වීම. |
| (ඉ) | **ක්ෂණික ලොතරැයිවල අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා ටී-ෂර්ට් මිලදී ගැනීම.** | | |
| | ගබඩාවේ ප්‍රමාණවත් තොග පවතින විට ඒ පිළිබඳ නොසලකා නැවත මිලදීගැනීම් සිදුකර තිබීම, ක්ෂණික ලොතරැයි පැවැත්වීම නිසි අලෙවි සැලැස්මක් අනුව සිදු නොකිරීම සහ මිලදීගත් අලෙවි ප්‍රවර්ධන අයිතම වෙනුවෙන් ක්ෂණික ලොතරැයි මුද්‍රණය කර වෙළඳපොළට ඉදිරිපත් නොකිරීම යනාදී කරුණු හේතුවෙන් ලොතරැයිවල අලෙවි ප්‍රවර්ධනය සඳහා මිලදීගත් රු.9,075,040 ක් වටිනා ටී ෂර්ට් 17,452 ක් නිෂ්කාර්යව පැවතුණි. | එකඟ වේ. සියයට 50 ක න්‍යාය ප්‍රතිශත සීමාවට යටත්ව මුද්‍රණකරුට මුද්‍රණය සඳහා ඇණවුම ලබාදෙන බවත් වෙළඳපොලේ පවතින උච්චාවචනයන් මත ටිකට්පත් ඇණවුම් කර ගෙන්වා ගැනීම නිසා මේ තත්ත්වය ඇතිව ඇති බව දන්වා ඇත. එසේම දැනට මෙම සියලු තොග ක්ෂණික ලොතරැයි සමඟ නිකුත් කර අවසන් බව දන්වා ඇත. | අලෙවි ප්‍රවර්ධන අයිතම මිලදීගැනීමේදී පවත්නා තොග මට්ටම් සැලකිල්ලට ගෙන විධිමත් අලෙවි සැලැස්මකට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | **ගිනි ආරක්ෂක පද්ධතිය මිලදී ගැනීම.** | | |
| | 2019 වර්ෂය තුළ මණ්ඩලය විසින් රු.2,357,000 ක් වැයකොට ගිනි ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර මේ සඳහා අවස්ථා 3 කදී මිල ගණන් කැඳවා තිබුණි. මෙම සැපයුම්කරු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයේ සෘජු මැදිහත්වීමක් සිදුවී නොතිබුණු අතර සැපයුම්කරු තෝරා ගැනීමෙන් පසුව ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන තිබුනි. ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කල ආයතන වලින් මිල ගණන් කැඳ වූ බවට සාක්ෂි නොවූ අතර මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 2න් එක් ආයතනයක් මෙම කාර්ය සඳහා තෝරාගත් ආයතනයට අනුබද්ධිත සමාගමක් විය. තවද එම ආයතන දෙකම ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කල ආයතන නොවීය. | එකඟ වේ. තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන මෙම ආයතනය තෝරාගෙන ඇති බවත් එම ආයතනයෙන් මෙම සේවාව ලබාගැනීමට ගිනි නිවන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත. | මිලදීගැනීම් කටයුතු ප්‍රසම්පාදනය අංශය මඟින් කළ යුතු බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

(ඇ) **LED Light Board මිලදීගැනීම.**

| | | | |
|---|---|---|---|
| **(i)** | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **2.5** හා **2.6** පරිච්ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන ඇගයීම් කමිටුව විසින් මිලදීගැනීම තීරණය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) විසින් රු.**1,358,810** ක් වටිනා ඉහත මිලදීගැනීම සිදුකළ යුතු ආයතනය තීරණය කර තිබුණි. | එකඟ නොවේ. එම සේවාව සපයන ආයතනය ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා තෝරාගෙන ඇති ප්‍රචාරණ ආයතනයක් බැවින් අනෙකුත් ප්‍රචාරණ කටයුතු මෙන් සභාපතිතුමාගේ මූල්‍ය බලතල යටතේ අනුමැතිය දී ඇති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| **(ii)** | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.9.1** (ආ) පරිච්ඡේදය අනුව රු.**500,000** ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ගිවිසුමකට එළඹිය යුතු වුවද මණ්ඩලය විසින් මෙම මිලදී ගැනීම ගිවිසුමකට අනුව සිදුකර නොතිබුණි. | එම සේවාව සපයන ආයතනය සමඟ මණ්ඩලය වාර්ෂික ගිවිසුමට එළඹ ඇති බැවින් අතිරේක ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතු වීම. |

## 3.8 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පරිගණක ගත පද්ධතීන් ස්ථාපිත කිරීම | | |
| මණ්ඩලය විසින් ලොතරැයි දිනුම් ඇදිම සඳහා දැනට භාවිතා කරන පරිගණක මෘදුකාංග සේවාව පෞද්ගලික සාමගමකින් ලබාගත් එකක් විය. වසරකට එකතුව රු.මිලියන **6.5** ක වැටුප් හා දීමනා ලබන විධායක නිලධාරීන් **04** දෙනෙකු ඇතුළුව එකතුව රු.මිලියන **9** ක වැටුප් හා දීමනා ලබන නිලධාරීන් **08** දෙනෙකු සහිත පරිගණක අංශයක් මණ්ඩලය තුල ස්ථාපිත කර තිබුණද, ඔවුන් ලවා පරිගණක සම්බන්ධ මෙම කටයුත්ත සිදුකර ගෙන නොතිබුණි. **2009** වර්ෂයේ සිට **2019** දෙසැම්බර් **31** දක්වා කාලය තුල මෙම පුද්ගලික ආයතනයෙන් ලබාගත් සේවය වෙනුවෙන් රු.**130,607,657** ක් ගෙවා තිබුණි. | එකඟ වේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතින බව. | ලොතරැයි දිනුම් ඇදීමේ පරිගණක ගත පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

(ආ) මණ්ඩලය සතු මුදල් බාහිර පාර්ශවයන් අත රඳවා තැබීම.

| | | |
|---|---|---|
| ------------------------------------------------------------ 2019 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලපරිච්ඡේදයට අදාලව දින 1 ත් දින 187 ත් අතර කාලයක් තුළ ලොතරැයි බෙදාහරින්නන් විසින් නොපියවා රඳවාගත් මුදල රු.1,638,032,144 ක් විය. අදාල මුදල් කඩිනම්ව මණ්ඩලයට ලබා ගැනීම සඳහා කළමණාකරණය විසින් සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි. | එදිනෙදා ගෙවනු ලබන මුදල් නිසිපරිදි ලබාගැනීමට පසුවිපරම් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇති බව. | නොපියවූ මුදල් කඩිනම්ව ලබාගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් කළමනාකාරීත්වය විසින් සකස් කළ යුතු වීම. |

(ඇ) මණ්ඩලය සඳහා කාර්ය පරිපාටි සංග්‍රහයක් සකස් කිරීම.

| | | |
|---|---|---|
| ------------------------------------------------------------ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආරම්භයේ සිටම පරිපාලන හා මෙහෙයුම් කටයුතු සම්බන්ධව කාර්ය පරිපාටි සංග්‍රහයක් සකස් කර නොතිබුණු අතර එම කාර්යය සඳහා 2016 වර්ෂයේදී සුදුසුකම්ලත් අයෙකු පත්කර තිබුණි. අදාළ පාර්ශවය විසින් පවත්නා නීති රීති අධ්‍යයනය කර අදාල කාර්යය පරිපාටි සංග්‍රහය පිළියෙල කර 2019 ඔක්තෝබර් 14 දින සංවර්ධන ලොතරැයි මණ්ඩලයට භාරදී තිබුණි. මෙම කාර්යය වෙනුවෙන් රු.4,500,000 ක් අදාල පාර්ශවයට ගෙවීමට එකඟ වී තිබූ අතර ඉන් රු.1,700,000 ක් මේ වන විට ගෙවා තිබුණි. ඔහු විසින් අදාල කාර්යය පරිපාටි සංග්‍රහය කොටස් දෙකකින් යුතුව මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණද මණ්ඩලයේ දැනට පවතින ක්‍රමවේදයට අනුකූල නොවන ලෙස මෙම කාර්යය පරිපාටි සංග්‍රහය සකස් කර ඇති බවට හේතු දක්වා ඉතිරි මුදල ගෙවීම අත්හිටුවා තිබුණි. තවද මෙම කාර්යය සඳහා අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන්ව තිබූ ''ලොතරැයි හා දිනුම් ඇදීමේ කටයුතු, අභ්‍යන්තර පාලනය සහ විගණන කටයුතු'' සඳහා වූ රීතින් සකස් කිරීම යන කාර්යයන් අත්හිටුවන ලෙස මණ්ඩලය විසින් එය සකස් කළ පාර්ශවය වෙත දන්වා තිබුණි. ඒ අනුව අදාල කාර්යය මේ වන තෙක් නිමවී නොතිබුණු අතර ඒ සඳහා වැයකර තිබූ මුදල සකසුරුවම් නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය. තවද මෙම කාර්ය සඳහා අත්සන් කරන ලද ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සහ ගෙවිය යුතු ඉතිරි මුදල පිළිබඳව නෛතික අවදානමක් පවතින බවද විගණනයේදී නිරීක්ෂණය විය. | එකඟ නොවේ. නැවත මෙම කෙටුම්පත සකස්කර ඉදිරිපත් කරන ලෙස සම්පත් දායකයාට දන්වා ඇත. ලබාදී ඇති කෙටුම්පත, ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිටපත් කර සකස්කරන ලද්දක් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමුවී ඇති බැවින් මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව නැවත කෙටුම්පත සකස්කර දෙන ලෙස සම්පත් දායකයාට දන්වා ඇති බව. | මණ්ඩලය කාර්ය පරිපාටි සංග්‍රහයක් ඉතා ඉක්මනින් සකස් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදයේ සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත යාවත්කාලීන සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයා වෙත යැවිය යුතු වුවත් මණ්ඩලය විසින් එය විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2019 වර්ෂයේ මාර්තු මස 06 වන දිනය. | එකඟ වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ජනවාරි 9 දිනැති අංක PE/MD/NLB/MO/2018 දරන ලිපිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධන වාර්තා හා මූල්‍ය හා භෞතික කාර්ය සාධන වාර්තා කාර්තුවක් අවසන් වී දින 30 ක් ඇතුළත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ හතරවන කාර්තුව සඳහා එකී වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය නොවීය. | එකඟ වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |